ඔබේ කටහඬ වැදගත්ය

# ඒකාබද්ධ කමිටු හඳුන්වාදීම

පුහුණුව | සමාජ සේවා | සංස්කෘතික දැනුවත්කම

ඵලදායීතාව | ආරක්ෂාව | කාර්ය සංවිධානය



International Labour Organization

State of Qatar
Ministry of Administrative Development, Labour & Social Affairs

TAAWON

**සේවකයෙකු ලෙස ඔබගේ අයිතිය වැදගත්ය! කතා කිරීමට, ප්‍රශ්නයක් හෝ බෙදාගැනීමට හොඳ අදහසක් ඔබට තිබිය හැකිය. නමුත් ඔබ ඒ ගැන කලමණාකාරීත්වය දැනුවත්කරන්නේ කෙසේද? එය කළ හැකි එක් ක්‍රමයක් නම් ඒකාබද්ධ කමිටුවකට සම්බන්ධ වීමෙනි.**



## ඒකාබද්ධ කමිටුවක් යනු කුමක්ද?

කටාර්හි කම්කරු නීතියට අනුව සේවකයන් 30කට වඩා ඇති සමාගම්වලට ඒකාබද්ධ කමිටුවක් පත්කළ හැකිය. ඒකාබද්ධ කමිටුවට ඔබේ සමාගමෙන් සේවකයන් සහ කලමණාකාර සාමාජිකයන් සමාන සංඛ්‍යාවලින් බඳවා ගැනේ.



## ඒකාබද්ධ කමිටුවක් විසින් මට උදව් කළ හැක්කේ කෙසේද?

ඔබට ප්‍රශ්නයක් හෝ යෝජනාවක් ඇත්නම්, ඒ ගැන කලමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීමට ඒකාබද්ධ කමිටුවක සේවක නියෝජිතයන්ට හැකිවේ.



## ඔවුන් හමුවන්නේ කොපමණ කාලයකට වරක්ද?

ඒකාබද්ධ කමිටු, වැඩපොළේ වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා අවම වශයෙන් මසකට වරක්වත් රැස්වේ.

## සේවකයන්ව නියෝජනය කරන්නේ කවුද?

ඒකාබද්ධ කමිටුවලට වසර දෙකක් සඳහා සේවකයන් විසින් ඔවුන්ගේ නියෝජිතයන් තෝරාගනු ලැබේ. ඔවුන් විසින් තම සහෝදර සේවකයන්ගේ ගැටලුවලට සවන් දී ඒවා සාකච්ඡා කරනු ලැබේ. ඒකාබද්ධ කමිටුවලදී ගත් තීරණ මොවුන් විසින් සේවක පිරිසට දැනුම් දෙනු ලැබේ.

## ඒ සඳහා මට අපේක්ෂකයෙක් විය හැකිද?

ඔබේ සමාගමේ ඒකාබද්ධ කමිටුවක් තිබේ නම්, සේවා නියෝජිතයෙකු ලෙස තෝරා පත්කර ගැනීම සඳහා ඔබට අපේක්ෂකයෙකු විය හැකිය.
සමාගමේ සෘජු ලෙස සේවය කළත්, ගිවිසුමක් හෝ නියෝජිතායතනයක් හරහා සේවය කළත්, සමාගමේ රැඳී සිට සේවය කරන්නේ නම් ඕනෑම සේවකයෙකුට අපේක්ෂකයෙකු විය හැකිය.
ඒ සඳහා වලංගු ගිවිසුමක් තිබිය යුතු අතර අවම වශයෙන් වසරක සේවය සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම කලමණාකාර සාමාජිකයෙකුද නොවිය යුතුය.



## මට ගෙවීමක් ලැබේද?

ඒකාබද්ධ කමිටු සාමාජිකයෙකුට අමතර ගෙවීමක් නැත. නමුත් එම රාජකාරී සඳහා තම සේවා කාලය තුළ අවස්ථාව දෙනු ලැබේ.



## ඒකාබද්ධ කමිටුවට තෝරාපත් කරගැනීමක් තිබෙන විට මා දැනුවත් වන්නේ කෙසේද?

ඔබේ සමාගමේ ඒකාබද්ධ කමිටුවට තෝරාපත් කරගැනීමක් තිබේ නම් සහ එය කෙසේ පවත්වන්නේද යන්න ඔබේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිවේදනය කරනු ඇත.

## මා තෝරාපත් වුවහොත් මට පුහුණුවක් ලැබේද?

ඔබ තෝරාපත් වුවහොත් ඔබ විසින් කළයුතු කටයුතු සහ වගකීම් පිළිබඳව ඔබව පුහුණු කෙරෙනු ඇත.

## මේ පිළිබඳව වැඩිවිස්තර ලබාගත හැක්කේ කොහෙන්ද?

වැඩි විස්තර සඳහා පිවිසෙන්න *www.www.ilo.org/qatar-office*